**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2022**

---

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල පනතේ 10(4) වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංශෝධිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිතයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදු වන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලාගනු ලැබිය යුතුය.

**2. විගණන නිරීක්ෂණ**

**2.1 විගණන විෂය පථය සීමාවීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂයන්වලට අදාළව සිදු කළ ගනුදෙනු සම්බන්ධයෙන් නිවැරදි, පැහැදිළි හා සම්පූර්ණත්වයෙන් යුතු තොරතුරු විගණනය වෙත අවශ්‍ය පරිදි ලබාදීමට භාරකාර මණ්ඩලය කටයුතු කර නොතිබුණි. අම්බුළුවාව පරිශ්‍රය තුළ පවත්වා ගෙන යනු ලබන කාර්යාලය තුල ලේඛන හා පොත්පත් විධිමත් පරිදි පවත්වා නොගන්නා අතර ඒ සඳහා බලය පැවරු වගකිව යුතු නිලධාරියෙකු කාර්යාලයේ සේවයේ යොදවා නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පිළිතුරු දීම හා කරුණු පැහැදිලිකර දීමට නිලධාරියෙකු නොමැති වීම පිළිගනිමි. ඒ සඳහා ඉදිරියේදී වගකිව යුතු නිලධාරියෙකු සේවයේ යොදවා ගැනීමට කටයුතු කරන බව. | බලය පැවරු වගකිව යුතු නිලධාරියෙකු කාර්යාලයේ සේවයේ යෙදවිය යුතුය. පොත්පත් හා ලේඛන විධිමත් පරිදි පවත්වාගත යුතුය. |

**2.2. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15.1 න් ඇතුළත් කල මුදල් රෙගුලාසි 877 (2) (ඇ) ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත සහතික කල මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යය සාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව පිළියෙල කර මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත කාලය තුලදී ඉදිරිපත් කල යුතුය. |

**2.3 ගිණුම් පොත්පත්, ලේඛන හා වාර්තා පවත්වාගෙන යාම.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් හා එහි වෙනස්වීම්වලට අදාළව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී එවැනි ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරන බව. | භාරකාර මණ්ඩලයේ වෙනස්වීම් පිළිබඳ විස්තර ඇතුලත් ලේඛනයක් නඩත්තු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂයන් සඳහා අරමුදල විසින් පොදු ලෙජරයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර යාවත්කාලීන ලෙජරයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | පොදු ලෙජරයක් පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ගෙවීම් කිරීමේදී අදාළ වවුචර් පිළියෙල කර ඒවා අංක කර මුදල් පොතේ හා වැය ලේඛනයේ සටහන් කර ගෙවිය යුතු වුවද, එසේ වවුචර් පිළියෙල කිරීමකින් තොරව ඍජුවම චෙක්පත් ලියා ගෙවීම් කර තිබුණි. චෙක්පොතේ පිළිපතේ පවතින විස්තර පදනම් කරගෙන පසුව මුදල් පොතේ ගනුදෙනු සටහන් කර වවුචර් පිළියෙල කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. | පෙන්වා දී ඇති අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගෙවීම් කිරීමේදී වවුචර් පිළියෙල කර මුදල් පොතේ හා වැය ලෙජරවල සටහන් කර ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අත්තිකාරම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරමි. සුළු මුදල් අත්තිකාරම් ලේඛනයක් නඩත්තු කර ඇති බව. | අත්තිකාරම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ භාරකාර මණ්ඩලයේ රැස්වීම් වාර්තා ඇතුළත් ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී සෑම මණ්ඩල රැස්වීම් වාර්තාවක්ම විගණනය වෙත ඉදිරිපත් කරන බව. | භාරකාර මණ්ඩලයේ රුැස්වීම් වාර්තා ඇතුලත් කර ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම් ඇතුළත් කර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සියලු ස්ථාවර වත්කම් ඇතුලත් කර ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කල යුතුය. |

## 2.4. ගිණුම්කරණ අඩුපාඩු.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංචාරක ආකර්ෂණය සඳහා කේබල් කාර් ව්‍යාපෘතියක් වෙනුවෙන් 2022 ජූලි මාසයේ මාර්ග ඉදි කිරීම සඳහා වැය කල රු.826,560ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා අදාල ආයතනවලින් තොරතුරු ලබාගෙන වත්කම් යටතට ගැනීමට කටයුතු කරන බව. | සංවර්ධන ව්‍යාපෘති වල වටිනාකම වත්කමස් ලෙස ගිණුම් ගත කල යුතුය. |

## 2.5. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු මුදල් වියදම්, කුලී, ඉන්ධන, විදුලි ගාස්තු, වැටුප්, අලුත්වැඩියා, මිලදී ගැනීම් යනාදී කාර්යයන්ට අදාළ එකතුව රු. 6,621,322 ක ගෙවීම් අවස්ථා 50 කට අදාළව බිල්පත්, ප්‍රමාණපත්, වියදම් දැරීමේ අවශ්‍යතාවය, තොග ලේඛන, පරීක්ෂණ වාර්තා හා පොලිස් පැමිණිලි, වැටුප්ලේඛන, ගිවිසුම් හා ඇස්තමේන්තු, පත්වීම් ලිපි හා අදාල තොරතුරු ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගෙවීම් වලට අදාල බිල්පත් සහතික උපයෝගී ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | නිර්මාතෘගේ පිළිරුව ආශ්‍රිත භූමිය සංවර්ධනය වෙනුවෙන් අදාළ භූමි කොටස කොන්ක්‍රීට් කළ බව පැවසුව ද, ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු, පිරිවැය ඇස්තමේන්තුව, මැනුම් පත්‍රය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. ඒ හේතුවෙන් එම කාර්යයට අදාළ වියදම හඳුනාගත නොහැකි වූ අතර එම වියදම් සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය. | මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා අදාළ ආයතන වලින් තොරතුරු ලබාගෙන වත්කම් යටතට ගැනීමට කටයුතු කරමි. | සංවර්ධන ව්‍යාපෘති වල වටිනාකම වත්කම් ලෙස මිනුම් ගත කල යුතුය. |

**2.6. නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 103 (1) හා 104 | අරමුදල සතු වාහනයක් ඉකුත් වර්ෂයේ දී අනතුරකට ලක්ව තිබුනද ඒ සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා අවසන් පරික්ෂණ සිදු කර නොතිබුණි. එසේම අනතුර සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර ද නොතිබුණි. | ඉදිරියේදී අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 115 | මාර්ග ඉදිකිරීමේ කටයුතුවල නිරත වූ සේවකයින්ට ආහාර පාන ලබාදීම වෙනුවෙන් 2021 දෙසැම්බර් මස රු.441,100 ක බිල්පත් ඉදිරිපත් වී ඉන් රු.220,550ක් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 10 දින ගෙවා තිබුණද ඒ සඳහා අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 135 | වියදම් සම්බන්ධයෙන් බලයදීම අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම වෙනුවෙන් බලතල පැවරීමක් සිදුකර නොතිබුණු අතර බලතල පැවරී නොතිබූ සේවකයන් දෙදෙනෙකු විසින් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වවුචර් අනුමත කිරීම හා සහතික කිරීම සිදුකර තිබුණි. | බලය ලබා දීම, සහතික කිරීම, ගෙවීම සම්බන්ධයෙන් බලතල ඉදිරියේදී නිසිපරිදි පැවරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 138 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස රු.5,390,189 ක ගෙවීම් වලට අදාල වවුචර් සහතික කර නොතිබුණි. | ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | ගෙවීම් වවුචර් සහතික කිරීමට කටයුතු කල යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මුදල් රෙගුලාසි 168 | සන්නිවේදන කුලුණු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.242,400 ක ආදායම් වෙනුවෙන් ලැබීම් කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන අතර මෙම මුදල් සෘජුවම බැංකුවට බැරවන නිසා ඒ සම්බන්ධයෙන් ලදුපත් නිකුත් කර නොමැති බව. | ලැබීම් සඳහා ලදුපත් නිකුත් කල යුතුය. |
| (vi) | මුදල් රෙගුලාසි 262(2) | ගෙවන ලද සියළුම වවුචර් පත්වල, ඒවා තහවුරු කෙරෙන ලියවිලිවලත් "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගෙවීම් වලට අදාල සියලු ලියිවිලි වල අදාල මුද්‍රාව යෙදිය යුතුය. |
| (vii) | මුදල් රෙගුලාසි 341 | ප්‍රවේශ පත්‍ර සහිත පොත් හා ලදුපත්, නිකුත් කිරීමේදී හා නැවත භාර ගැනීමේදී සටහන් කිරීම සඳහා උප පත්‍රිකා පොත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී ලේඛනයක් නඩත්තු කරන බව. | උපපත්‍රිකා පොත් ලේඛනයක් නඩත්තු කල යුතුය. |
| (viii) | මුදල් රෙගුලාසි 386(3) | ලියනු ලබන සෑම චෙක්පතකම උප පත්‍රිකාවෙහි අදාළ වවුචර් අංකය සඳහන් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී නිවැරදි කරන බව. | චෙක්පත් උප පත්‍රිකාවල වවුචර් අංකය සඳහන් කල යුතුය. |
| (ix) | මුදල් රෙගුලාසි 392 | සමාලෝචිත වර්ෂයේ මැයි මස සේවක අර්ථ සාධක අරමුදලට ගෙවා තිබූ චෙක්පතක් නිශ්කාශනය නොවී තිබියදී අදාල විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව 2022 දෙසැම්බර් මස නැවත චෙක්පතක් නිකුත්කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (x) | මුදල් රෙගුලාසි 395 (1) | සමාලෝචිත වර්ෂය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 අංක 44 දරන භාර අරමුදල් පනතේ 4 වන වගන්තියේ වූ අරමුණු 20 න් අරමුණු 16ක් ඉටුකර ගැනීම සඳහා භාරකාර මණ්ඩලය විසින් ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | භාර අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක්, ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රගති වාර්තා පිළියෙල කල යුතුය. |
| (ඇ) | මෙම සංකීර්ණයට අයත් ඉඩම් අක්කර 400 ක් පවතින බව සඳහන් වුවත්, එම ඉඩම් මැණුම්කර අදාළ මිනුම් වාර්තා භාරය වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල මිනුම් වර්තා ලබා ගැනීමට කටයුතු කරන බව. | භාරයට අයත් ඉඩම් මැනුම් කර වාර්තා ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අම්බුළුවාව අරමුදල නමින් මහා භාරකාරවරයා යටතේ පවතින සියළු මුදල් හා අම්බුළුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදල නමින් බැංකුවල පවතින මුදල් පිළිබඳ තොරතුරු හා ලේඛන, භාරය මගින් ලබාගෙන නොතිබුණි. | මහා භාරකාරවරයා සතු පැවති අරමුදල වෙනුවෙන් පවත්වාගත් මුදල සම්බන්ධයෙන් සියලු කටයුතු මහාභාරකාරවරයා සිදු කල බැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් අප සතුව නොමැති බව. | භාරකාර අරමුදලට අදාලව මහා භාරකාරවරයා සතුව පවතින වත්කම් පිළිබඳ සියලු තොරතුරු ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයට ඇතුළත්වීම සඳහා පරිගණක භාවිතයෙන් නිකුත් කර තිබුණු අවසරපත් අලෙවියට අදාළව දෛනික ආදායම් වාර්තාව හා මාසික සාරාංශ වාර්තාව ලබා ගැනීමට හා එය වගකිවයුතු අයෙකුගේ අධීක්ෂණයට ලක්කර ගොනුකර තැබීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | දෛනික හා මාසික ආදායම් වාර්තා වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පවත්වා ගත යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයේ අරමුදල් භාරයේ සේවකයින් 26 දෙනෙකු සේවය කර තිබුණද භාරකාර මණ්ඩල තීරණයකින් තොරව සේවකයින් 37 දෙනෙකුට අලුත් අවුරුදු පාරිතෝෂික දීමනා එකතුව රු.697,500 ක් ගෙවා තිබුණි. ඒ අතරින් අරමුදල් භාරයේ සේවය නොකරන 11 දෙනෙකුට එක් අයෙකුට රු.12,500 බැගින් රු.137,500 ක පාරිතෝෂික දීමනා අවිධිමත්ව ගෙවා තිබුණි. එසේම එම ගෙවීමට අදාළ පුද්ගලයින් 33 දෙනෙකු වෙත ගෙවන ලද එකතුව රු.602,500 ක දීමනා ලබාගත් බවට අත්සන් ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අම්බුළුවාව පරිශ්‍රයේ සේවය කරන පොලිස් නිලධාරීන්ගේ පවුලේ අයට මෙම වැඩිපුර ගෙවීම් සිදුකර ඇත. මෙම අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | භාරකාර මණ්ඩලයේ තීරණ ලබා ගෙන ක්‍රමාවේදයකට අනුව සේවය කරන කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අරමුදල් භාරය සතු සම්මන්ත්‍රණ ශාලාව අරමුණුගත කාර්යයට යොදවා ගැනීමකින් තොරව වෙනත් ව්‍යාපාරික කටයුත්තක් සඳහා සමාලෝචින වර්ෂයේ මාර්තු 10 දින සිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව බදු පදනම මත පෞද්ගලික සමාගමක් වෙත ලබාදී තිබුණි. | මේ සම්බන්ධයෙන් වෙබ් අඩවියේ දැන්වීම් කල කර ඇති බව. | වත්කම් අරමුණු ගත කාර්යය සඳහා යොදවා ගත යුතුය. |
| (ඇ) | ජෛව විවිධත්ව සංකීර්ණයේ සවිකර තිබුණු වතුර මෝටරයේ අළුත්වැඩියාව සිදු කර පෞද්ගලික ආයතනයක් රු.159,745 ක බිල් ඉදිරිපත් කර තිබුණද අදාල සේවාදායක ආයතනයට 2022 දෙසැම්බර් 02 දින ඉන් රු.60,000 ක් ගෙවා 2022 නොවැම්බර් 26 දින වෙනත් බාහිර පාර්ශවයකට රු.100,000 ක් අවිධිමත්ව ගෙවා තිබුණි. | රු.100,000 ක ගෙවීම පිළිබඳ සොයා බලා පසුව පිලිතුරු ලබා දීමට කටයුතු කරන බව | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර සේවා ලබා ගත යුතුය. |
| (ඈ) | එකතුව රු.2,214,825 ක ගෙවීම් වවුචර් 16 ක ගෙවීම් තුල බිල්පත් ඉදිරිපත් නොකල එකතුව රු.609,845 ක් සඳහා වැඩිපුර ගෙවා අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. | සොයා බලා පසුව පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | බිල්පත් වලින් අදාල ගෙවීම තහවුරු කල යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පාලනය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයේ කෘෂි ගොවිපොල හා පස සංරක්ෂණය සඳහා ගල්වැටි ඇල්ලීම සඳහා රු.1,063,080 ක් ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) | ව්‍යාපෘතියට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙලකර අනුමත කරගෙන නොතිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර නොමැති බව. | ව්‍යාපෘති ඉටු කිරීමේදී ඇස්තමේන්තු සකස් කර අනුමත කර ගත යුතුය. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදයට අනුව තරඟකාරී මිල කැඳවීමකින් තොරව බාහිර පාර්ශ්වයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | ගල්වැටි බැඳීම සඳහා වර්ග අඩියකට රු.90 ක් ගෙවීමට දෙපාර්ශවය දින රහිත ගිවිසුමකින් එකඟවී ඇතත්, වර්ග අඩියකට රු.90 ක රේටය ගණනය කළ ආකාරය විගණනයට අනාවරණය නොවුන අතර ගිවිසුම් ප්‍රකාරව වර්ග අඩියකට රු.90 ක් ගෙවිය යුතු වුවත්, බිල්පත් සකස් කිරීමේදී, ඝන අඩියකට රු.90 බැගින් ගෙවීම නිසා රු.616,410 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගිවිසුම්ගතවීමේදී වරදක් සිදු වී ඇති බව | ගිවිසුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්ශවය අත්සන් කළ ගිවිසුමේ පළමු පාර්ශවය ලෙස අත්සන් කළ අම්බුළුවාව ජෛව විවිධත්ව අරමුදලේ ඉදිකිරීම් උපදේශකවරයාම ව්‍යාපෘතියේ මිනුම් ගෙන බිල්පත් සකස් කර, ගෙවීම් වවුචර්පතේ ගෙවීම් නිර්දේශ කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර කටයුතු කල යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අරමුදල සතු එකතුව රු.9,130,000 ක ටොයෝටා වර්ගයේ මෝටර් රථය හා විදුලියෙන් ක්‍රියා කරන යතුරු පැදිය භෞතිකව පවතින බවට හා භාරයේ කටයුතු සඳහා යොදවාගත් බවට තහවුරු කිරීම සඳහා තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | විදුලි යතුරු පැදියේ විදුලි බැටරිය අළුත්වැඩියා කිරීමට කොළඹ රැගෙන ගොස් ඇත. මෝටර් රථය දැනට සංචිත වාහනයක් ලෙස භාවිතා කරයි. ධාවන සටහන්, ලොග් පොත, අළුත්වැඩියා ලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරමි. | අරමුදල සතු වත්කම් අරමුදලේ කටයුතු සඳහා යෙදවගෙත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය වන විට වටිනාකම හෙළිදරව් නොකළ ගොඩනැගිලි 03 ක් වසර 2 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුනි. | වටිනාකම සඳහන් නොවූ ගොඩනැගිලි තුන ඉදිරියේදී භාවිතා කිරීමට කටයුතු කරන බව. | භාරය සතු වත්කම් ඵලදායී කටයුතු වල යෙදවිය යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂ 02 තුල මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, අම්බුළුවාව පරිශ්‍රයට ඇතුළු වන ප්‍රධාන පිවිසුමේ සිට අභ්‍යන්තර මාර්ගයේ කිලෝ මීටර් 6 ක ප්‍රමාණයක් ABC අතුරා කාපට් කිරිම.2021 වර්ෂයේදී පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අම්බුළුවාව පරිශ්‍රයේ පිහිටි වැවේ සොරොව්ව හා වැව් බැම්ම අළුත්වැඩියා කිරීම සහ ඇවිදින මංතීරුව දෙපස පෙරසැරි කුට්ටි ගල් ඇල්ලීම. | පිළිගනිමි. මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා අදාළ ආයතන වලින් තොරතුරු ලබාගෙන වත්කම් යටතට ගැනීමට කටයුතු කරමි. | සංවර්ධන ව්‍යාපෘති වල වටිනාකම වත්කම් ලෙස මිනුම් ගත කල යුතුය. |

## 3.6 සේවක මණ්ඩල කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාර අරමුදල් පනතේ 6(2)(ඊ) ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කර අනුමත කර ගැනීමකින් තොරව ජෛව විවිධත්ව සංකීර්ණයේ සේවකයින් 23 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | බඳවා ගැනීමේ පටපාටියක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | භාරකාර මණ්ඩලය විසින් සේවයේ යොදවාගෙන ඇති කාර්ය මණ්ඩලය වෙත විධිමත් පත්වීම් ලිපියක් හෝ සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් සේවා ගිවිසුම් අත්සන් කරගෙන හෝ නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් විධිමත් පත්වීම් ලිපි හා සේවා ගිවිසුම් පවත්වා ගත යුතුය. |
| (ඇ) | අරමුදල විසින් සේවකයන් ක්ෂේත්‍රයේ සේවයේ යෙදවීමේදී, ඊට අදාළ මාසික හෝ දෛනික සේවා මුර ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | මාසික හෝ දෛනික සේවා මුර ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාර අරමුදලේ කාර්යාල කටයුතු ඉදිකිරීම් උපදේශක සහ ගිණුම්කරන සහයක විසින් ඉටුකරන නමුත් ඒ සම්බන්ධයෙන් බලය පැවරූ ලිපියක් හෝ පත්වීම් ලිපියක් ලබාදී නොතිබුණි. එසේම අභ්‍යන්තර පරික්ෂාවක් සිදුවන පරිදි වැඩ බෙදීමක් සිදුකර නොතිබුණු අතර, අභ්‍යන්තර පාලනය ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි. | ඉදිරියේදී විධිමත් කිරීමට කටයුතු කරන බව. | විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හදුන්වාදිය යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15.1 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1)(ඇ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කර ගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කර ගත යුතුය. |